# බෞද්ධ අධ්‍යාපනය : එහි දාර්ශනික හා මනෝවිද්‍යාත්මක පදනම්

ධර්මසේන හෙට්ටිආරච්චි

බුදු රජාණන් වහන්සේ ගුරුවරයෙකි. අසාමාන්‍ය ශ්‍රේෂ්ඨ ගුරුවරයෙකි. පාලි ත්‍රිපිටකයෙහි නිතර හමුවන නව අරහාදි බුදු ගුණ පාඨයෙහි 'සත්ථා දේවමනුස්සානං' (දෙව්මිනිසුන්ගේ ගුරුවරයා) යනුවෙන් ගුරුවරයකු වශයෙන් බුදුරදුන්ගේ සුවිශේෂත්වය අවධාරණය කෙරේ.[1] නව බුදුගුණ පාඨය හැදෑරීමෙන්, බුදු රදුන්ගේ ආධ්‍යාත්මික නායකත්වය පිළිබඳ පැහැදිලි අදහසක් ඇති කර ගතහැකි බව, බුද්ධ චරිතය හා ක්‍රිස්තු චරිතය සම්බන්ධ තුලනාත්මක අධ්‍යයනයක යෙදෙන මහාචාර්ය ලිලී ද සිල්වා පවසයි.[2] දෙව්මිනිසුන් අතර අධ්‍යාපන කාර්යයෙහිලා ශාස්තෘන් වහන්සේගේ අසහාය වටිනා ගැනීම බෞද්ධ අධ්‍යාපනයෙහි පදනම් විමර්ශනයෙහි දී බෙහෙවින් වැදගත් වේ.

මෙහි 'අරහං' හෙවත් අර්හත්වය, රහසින්වත් කයින්, වචනයෙන් හෝ මනසින් කිසිදු වරදක් නොකිරීම නිසා ලද පුදුසු බව - සම්පූර්ණත්වය - ප්‍රකට කරයි. ස්වෝත්සාහයෙන් පූර්ණ අවබෝධය ලබා තිබීම 'සම්මාසම්බුද්ධ' ගුණයයි. විද්‍යා හෙවත් අති විශේෂ ඥාණයෙන් හා පරමාදර්ශී චර්යාවෙන් යුක්ත බව 'විජ්ජාචරණ සම්පන්න' ගුණයෙන් කියැවේ. පෙර බුදුවරුන් විසින් අනුගමනය කරන ලද නිවැරදි සෘජු මාර්ගයෙහි ගමන් ගත් හෙයින් බුදුනු 'සුගත' නම් වෙති. මිනිසාගේත් ලෝකයේත් ස්වභාවය නිරවුල් ව දත් බව 'ලෝකවිදූ' ගුණය වේ. දමනය කළ යුතු සියල්ලන් දමනයෙහි පොහොසත් බව 'අනුත්තර පුරිසදම්මසාරථි' ගුණයෙන් අදහස් කෙරේ. දෙව්මිනිසුන්ගේ ගුරුවරයා යන්නය, 'සත්ථා දේවමනුස්සානං' ගුණයෙන් කියැවෙනුයේ. සමින් වහන්සේ අවබෝධය ලබා ගෙන අනුන්වත් අවබෝධ කරවීමේ ශක්තිය ඇති බව ය, 'බුද්ධ' නම්. උතුම් යහපත සලසා ගැනීම 'භගවා' ගුණය වේ.